1st Place Winner
National Productivity
Award 2020

SLSI SYSTEM CERTIFIED ISO 9001

SLAB ACCREDITED ISO/IEC 17021 QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
# பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
# CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref. CSS/7/7/4 | ඔබේ අංකය / உனது இல / Your Ref. | දිනය / திகதி / Date 2023.~~11~~.12.08 |

**ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) - 03/2023**

දකුණු පළාත් සභාවේ සියලුම
ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්,
ගණන් දීමේ නිලධාරීන් වෙත.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාතේ, පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහය - 2021 හි අංක 416.1 දරන රීතිය සංශෝධනය කිරීම**

රාජ්‍ය හා පෞද්ගලික හවුල් ක්‍රියාකාරීත්වය යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති, සංවර්ධන කටයුතු සඳහා නියමිත, “1998 රජයේ ටෙන්ඩර් පටිපාටියේ II කොටස” රීති ගත කරමින් උක්ත මුදල් රීතිය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට ගරු ආණ්ඩුකාරතුමා විසින් 2023.11.30 දිනැතිව අනුමැතිය ලබා දී ඇති බව, ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/1/1/2/2023 දරන 2023.12.04 දාතම ලිපිය මඟින් දන්වා එවා ඇති බව මෙයින් කාරුණිකව දන්වමි.

02. මේ සම්බන්ධයෙන් ඔබ අමාත්‍යාංශයට/ දෙපාර්තමේන්තුවට අයත් සියළුම ආයතන දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

> **රී.416.1**
>
> පළාත් සභා අරමුදලින් කෙරෙන සියලු භාණ්ඩ, වැඩ හා උපදේශක නොවන සේවා සැපයීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2007 (ඖෂධ සහ වෛද්‍ය සැපයීම්) සහ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය 2006 අදාළ කර ගත යුතු ය.
>
> තවද, උපදේශක සේවා සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2007 අදාළ කර ගත යුතු ය.
>
> එසේම පෞද්ගලික අංශය හවුල්කාරීත්වය දරන යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති සඳහා, රජයේ ටෙන්ඩර් පටිපාටිය - II කොටස (1998) අදාළ කර ගත යුතු ය.

**සුමිත් අලහකෝන්**
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත් : 01. ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති, දකුණු පළාත. - දැ.ගැ.පි.
02. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත. - දැ.ගැ.පි.

දුරකථන : 091-49 44 007 ෆැක්ස් : 091-22 32 691 විද්‍යුත් තැපැල : depoffinance7@gmail.com

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 4944002 | කාර්යාලය / காரியாலயம் / Office 091 4119011, 091 2234052 | ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299 | විද්‍යුත් තැපැල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

“සෞභාග්‍යමත් දකුණු පළාතක්”